## වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි නියාමන සේවා ගණය RS1- 2016 සඳහා උසස් කිරීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව
යොමු අංකය : වෙසං/පාලන/බ.ගැ.-2015 දිනය:2018.01.05

1.2 අමාත්‍යාංශය :මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
යොමු අංකය : 02/02/Adm/08/19(IV) දිනය:2018.01.16

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය :DMS/C1/1/09 දිනය: 2013.01.31

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST/2/RECRU/06/6236 දිනය: 2017.12.11

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමුඅංකය :NSCC/07/02/64/SR දිනය:2017.07.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමුඅංකය :PSC/EST/04-01-30/01/2016 දිනය:2018.09.18

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : නියාමන සේවා

3.2 තනතුරු නාමය : වෙරළ සංරක්ෂක නියාමක
වෙරළ සංරක්ෂක සැරයන්

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :
ආයතනයේ දැක්ම, අරමුණු හා වගකීම් සාක්ෂාත් කර ගැනීම සඳහා පවරනු ලබන බල ප්‍රදේශය තුල ක්ෂෙත්‍ර රාජකාරි කටයුතු කරමින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ දෙපාර්තමේන්තු නියෝග හා චක්‍රලේඛ අනුව වෙරළ කලාපය තුල අනවසර ඉදිකිරීම් වාර්තා කිරීම,අනවසර වැලි ප්‍රවාහනය හා හිරිගල් ඉවත් කිරීම් පාලනය ඇතුලු එවැනි වැටලීම්වලට සහය වී අදාල අධිකරණ කටයුතු වලට සහය ලබාදීම.

3.4 කාර්යයන් පැවරීම :
ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය).

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : RS1-2016

5.2 වැටුප් පරිමාණය : රු.29,540 – 07 x 300 – 27 x 370 – රු.41,630/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| වෙරළ සංරක්ෂණ නියාමක | 01 පියවර | 29,540/- |
| වෙරළ සංරක්ෂණ සැරයන් | 05 පියවර | 30,740/- |

2016 සිට 2020 දක්වා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුරු/ තනතුරු

### 6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| වෙරළ සංරක්ෂණ නියාමක | 138 | • අනවසර ඉදිකිරීම් වැළැක්වීම සහ නීතිමය පියවර ගැනීමට වාර්තා කිරීම.<br>• අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සහ ඒ පිළිබඳ ලැබෙන මහජන පැමිණිලි සඳහා පරීක්ෂා කිරීම් සිදුකිරීම.<br>• හඳුනාගත් අනවසර ඉදිකිරීම් පිළිබඳව තම වෙරළ කළාප කොට්ඨාශයේ පොලිස් ස්ථානයේ පැමිණිලි කිරීම.<br>• හඳුනාගත් සියළුම අනවසර ඉදිකිරීම් පිළිබඳව ප්‍රධාන කාර්යාලයට දැනුම් දීම.<br>• වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන කඩා ඉවත් කිරීමේ නියෝග අදාළ පුද්ගලයන්ට භාරදීම හා ඒ බව ප්‍රධාන කාර්යාලයට දැනුම් දීම.<br>• වෙරළ අපවිත්‍ර කිරීම වැළැක්වීම.<br>• මුහුදු වැලි ඉවත් කිරීම පාලනය හා වැලි ඉවත් කිරීමේ බලපත්‍ර අධීක්ෂණය. |
| වෙරළ සංරක්ෂණ සැරයන් | 27 | • වෙරළ සංරක්ෂණ නියාමකවරුන්ගේ සියලු කටයුතු අධීක්ෂණය කිරීම.<br>• අනවසර ඉදිකිරීම් වැළැක්වීම සහ නීතිමය පියවර ගැනීම. මේ සඳහා නියාමකවරුන් මෙහෙයවීම.<br>• වෙරළ කළාපය තුළ සිදුකරනු ලබන අනවසර හා හානිදායක ක්‍රියා වැළැක්වීමට පරීක්ෂකගේ උපදෙස් මත ක්‍රියා කිරීම.<br>• නියාමකවරුන්ගේ දෛනික වාර්තා වෙරළ සංරක්ෂණ පරීක්ෂක වෙත යොමු කිරීම. |

### 6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව:

| | |
|---|---|
| වෙරළ සංරක්ෂණ නියාමක | 138 |
| වෙරළ සංරක්ෂණ සැරයන් | 27 |

07. බඳවා ගැනීමේ ක්‍රමය : දැනට සේවයේ යෙදී සිටින වෙරළ සංරක්ෂණ සැරයන් සහ වෙරළ සංරක්ෂණ නියාමක නිලධාරීන්ට පෞද්ගලික වනසේ RS 1-2006 වැටුප් පරිමාණය ලබා දී ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලා/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට පත්වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | වෙරළ සංරක්ෂණ සැරයන් තනතුරට උසස්වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම 02) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

09. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ දී ලබාගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

10 . ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම: පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල සැලකිල්ලට ගනිමින් වෙරළ සංරක්ෂණ නියාමක නිලධාරීන් වෙරළ සංරක්ෂණ සැරයන් තනතුරට පත් කිරීම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලබයි.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූකොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ;

**සක්‍රිය සේවා කාලය**

"සක්‍රිය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුලත්, නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් "රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17.අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ..............................     පරීක්ෂා කළේ : ..............................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ
දෙපාර්තමේන්තුව

දිනය : 2018.10.17     නිලමුද්‍රාව : ..............................

යොමු අංකය : 02/02/Adm/08/19(IV)

2018.09.18 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : අනුර දිසානායක

ලේකම්

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

දිනය : 2018.11.07     මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
නිලමුද්‍රාව : ..............................

යොමු අංකය : PSC/EST/04-01-30/01/2016

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2018.09.18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9. රජමල්වත්ත පාර.
බත්තරමුල්ල

දිනය : 2018/12/20     නිල මුද්‍රාව : ..............................

ඇමුණුම 01

<u>පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

01. විභාගයේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණය (RS1- 2016) සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය (ලිඛිත) | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| 2.මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

❖ <u>කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය</u> -

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.කාර්යාල පරිපාලන සහ ආයතන සංග්‍රහය | මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>II වන පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටි සහ පත් කිරීම<br>III වන පරිච්ඡේදය - මාරු කිරීම්<br>IV වන පරිච්ඡේදය - මාස් පඩි තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය සහවිශ්‍රාමවැටුප් හිමිකම ප්‍රදානය කිරීම.<br>V වන පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරලා යැවීම හා සේවය අවසන් කිරීම<br>VIII වන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>IX වන පරිච්ඡේදය - ගාස්තු<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුළත රාජකාරි ගමන්<br>XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XVIII වන පරිච්ඡේදය - නිල නිවාස<br>XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම්<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි හා විධි<br>XXX වන පරිච්ඡේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII වන පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLVII වන පරිච්ඡේදය -සාමාන්‍ය හැසිරීම හා විනය |

| | |
|---|---|
| 02. මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද අදාළ වේ.<br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු (මු.රෙ. 01 සිට 68 දක්වා)<br>III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව (මු.රෙ.124 – 147 දක්වා) |

අත්සන : ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2018.10. 17

නිල මුද්‍රාව : බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව

ඇමුණුම 02

<u>දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

01. විභාගයේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණය (RS1- 2016) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය (ලිඛිත) | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත හා එයට අදාළ රෙගුලාසි | පැය 02 | 100 | 40 |
| වෙරළ කලාප කළමනාකරණ සැලසුම | පැය 02 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත හා එයට අදාළ රෙගුලාසි | i. වෙරළ කලාපයේ පරිපාලනය<br>ii. වෙරළ කලාපය කළමනාකරණය කිරීම.<br>iii. අවසරපත්‍ර පිළිබඳ කාර්ය පරිපාටිය. |
| වෙරළ කලාප කළමනාකරණ සැලසුම | i. නියෝගාත්මක පද්ධතිය |

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2018.10.17

නිල මුද්‍රාව

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ
දෙපාර්තමේන්තුව